## ජාතික වැවිලි කළමනාකරණ ආයතනය
**එම්.ඩී.එච්. ජයවර්ධන මාවත, අතුරුගිරිය.**

### ඉතිහාසය කෙටියෙන්

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය 1979 අංක 45 දරණ ජාතික වැවිලි කළමනාකරණ පනතින් ස්ථාපිත කරන ලදී. මෙම පනත 1981 අංක 76 දරණ පනතින්ද, 1987 අංක 05 දරණ පනතින්ද සහ 2003 අංක 38 දරණ පනතින්ද සංශෝධනය කරන ලදී. මෙම පනත්වලට අනුව ජාතික වැවිලි කළමනාකරණ ආයතනය වැවිලි ක්ෂේත්‍රයට සම්බන්ධ සියළුම ශ්‍රේණිවලට අයත් පුද්ගලයින්හට පුහුණුව සැපයීම සහ උපදේශක සේවා සැපයීමේ ප්‍රධාන ආයතනය බවට පත්වී ඇත. එය පුහුණු වැඩසටහන් සහ අධ්‍යයන පාඨමාලා සාර්ථකව සම්පූර්ණ කරන අය සඳහා සහතික පිරිනැමීමට හා සුදුසුකම්ලත් වැවිලි අංශයේ විධායකයින්ට ආයතනයේ වෘත්තීය සාමාජිකත්වය පිරිනැමීමට බලයලත් එකම ආයතනයයි. එය කුඩා වතු අංශය ඇතුළුව වැවිලි ක්ෂේත්‍රයේ සේවය කරන අයගේ වෘත්තීය නිපුනතාවය ඉතා ඉහළ තත්ත්වයක පවත්වා ගැනීම සහතික කරයි.

### ආයතනයේ ප්‍රධාන අංශ

පුහුණු කිරීම්, පරිපාලන සහ මූල්‍ය යන අංශ තුනකින් සමන්විත වේ.

### අරමුණු

1. කුඩා වතු අංශය ඇතුළුව වැවිලි ක්ෂේත්‍රයන්හි සේවය කරන සියළුම ශ්‍රේණිවලට අයත් පුද්ගලයින් සඳහා පුහුණුව සැපයීම.
2. වැවිලි කළමනාකරණය පිළිබඳ උපදේශක සේවා සැපයීම සහ සමීකරණ සිදු කිරීම.
3. සුදුසුකම්ලත් වැවිලි අංශයේ විධියකයින් සඳහා ආයතනයේ වෘත්තීය සාමාජිකත්වය පිරිනැමීම.

### ක්‍රියාකාරකම්

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය වැවිලි කළමනාකරණයට අදාල පුහුණු වැඩසටහන් මෙන්ම විවිධ පාඨමාලා පවත්වන අතර පුහුණු පහසුකම්ද සපයයි. වයඹ විශ්ව විද්‍යාලය සමඟ ඒකාබද්ධව පවත්වනු ලබන වැවිලි කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය, වැවිලි කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා සහ විවිධ මාතෘකා යටතේ සහතික පාඨමාලා, වතු අංශයේ කාර්ය මණ්ඩලය සඳහා කුසලතා වර්ධන පුහුණු වැඩසටහන්, විධායකයින් සඳහා ව්‍යාපාරික සහ කළමනාකරණ සංවර්ධන පාඨමාලා සහ වතු සේවකයින් සඳහා නිපුනතා සංවර්ධන වැඩසටහන් යනාදිය ජාතික වැවිලි කළමනාකරණ ආයතනයෙන් ඉටු කෙරෙන ක්‍රියාකාරකම්වලින් කීපයකි. මෙම ආයතනය වැවිලි කළමනාකරණය පිළිබඳ විවිධ සඟරා අත්පොත් සහ වෙනත් කාලීන පුවත් ලිපි ආදිය ප්‍රසිද්ධ කරයි.

### සම්බන්ධවිය හැකි පුද්ගලයන්

| නම | දුරකථන අංකය | ෆැක්ස් අංකය | විද්‍යුත් තැපැල |
|---|---|---|---|
| සභාපති - ඉන්ද්‍රාණි සුගතදාස මිය | 4402979 | 4403479 | nipm@sltnet.lk |
| අධ්‍යක්ෂ වැ.බ.- පී.ඩබ්.ඒ. කපිලවංශ මයා | 4403476 | 4403479 | nipm@sltnet.lk |
| කාර්යාලය | 2770232 | 4403479 | nipm@sltnet.lk |